# ආකල්ප , සාමය හා භාවිතය

සංස්කෘතික උරුමයන් සමග බැඳී, කාලයක් තිස්සේ වර්ධනය කරගත් සහසබඳතාවන්, සැකය හා බිය මුසු පරිසරයක කොටු කිරීමට යුදකාමීන්ට අවැසි වන්නේ ඉතා කෙටි කාලපරිඡේදයකි. වසර දහස් ගණනක ඓතිහාසික වටිනාකම් ඒ තුළ විනාශ වී යන්නේ ද නිරායාසයෙනි. මේ තුළ කිමිදෙමින් පවත්නා දේශයක් ලෙස වඩාත් නිවැරදි ව හැඳින්විය හැකි වන්නේ වත්මනෙ හි වර්ධිත තත්ත්වයන් ග්‍රහණය කරගත හොත් පමණි.

බොහෝ විට යුද්ධයක දී විනාශවන සම්පත් ඝනයෙ හි ලා සැලකීමට බොහෝ දෙනා පුරුදු වී සිටිනුයේ, ඇසට ගෝචර වන විෂයය පථයන් ගණනය කිරීමෙනි. ගහ-කොළ, සතා සිව්පාවා හෝ ජීවිත හෝ හැරුණු විට විනාශ වන පොදු භෞතික සම්පත් සේ ඔවුහු ඒවා හඳුනා ගනිති.

එයට අමතරව යුද්ධය හා ඉන් ඇතිවන බලපෑම තක්සේරු කිරීමට ඇතැමුන් යොදා ගනු ලබන්නේ, රාජ්‍ය හා ඒ හා බැඳුණු මට්ටමින් කරනු ලබන යුද වියදම් ය. ව්‍යවස්ථාදායකය විසින් කරනු ලබන යුද වැය ශීර්ෂ මත වත්මන් ගැටලුවේ උච්ඡාවචනයන් විග්‍රහ කිරීම ද එහිම එක් අංගයකි. මේ සියල්ල සාමාන්‍ය හෙවත් ඉතා නො වැදගත් තත්ත්වයෙ හි ලා සැලකිය යුතු වුවත් වත්මන් සමාජය උත්තරාරෝපිත මේ තත්ත්වයෙහි වහලුන් වී හමාර ය.

වත්මන් අර්බුදයට විසඳුම් සොයා යන ගමනේ දී වැදගත් මෙහෙවරක නිරත වන මාධ්‍ය කරුවා හා බුද්ධියේ නිම් වලලු පුළුල් කර ගැනීමට රිස් සේ මාධ්‍ය පරිශීලනයේ යෙදෙන පාඨකයා, ඉහත තලයේ සිරකරුවන් නොවනු ඇත. එහෙත් අවාසනාවක මහත. බොහෝ ප්‍රවීණ හෝ ජ්‍යෙෂ්ඨ යැයි හඟවන එවැන්නන් විසින් සිදු කරනුයේ භෞතික විනාශයන් මත පමණක් පිහිටා සිය කාර්යයට පණ පෙවීම ය.

මෙ ලෙස ගත් කළ, යුද පසුබිමක් තුළ විනාශ වී යන සංස්කෘති උරුමයන් හා සහසබඳතා පිළිබඳ වන කතිකාවත පසුබෑමකට ලක් වී ඇත. එසේත් නොමැති නම් හිතාමතා ම හෝ බලහත්කාරයෙන් හෝ එම ප්‍රගමනයන්ට බාධා පමුණුවා ඇත. වර්තමාන ජාතික ගැටලුවේ ප්‍රවේශයන් විශ්ලේෂණය කළ ද දක ගත හැකි වන්නේ මෙයට සමාන තත්ත්වය කි.

සර්ව ජන ඡන්ද බලය හිමි වීමෙන් පසුව එළැඹෙන පාර්ලිමේන්තු සම්ප්‍රදාය තුළ දී මූලිකව ම වාමාංශික බලවේග නිහඬ කරවීම උදෙසා, ජාතික

නිෂ්පාදන ක්‍රියාවලියේ ද කොටස්කරුවන් වූ සුළු ජාතිකත්වයේ කොටසක මූලික අයිතීන් උල්ලංඝණය කිරීමට පුරවැසි පනත ගෙන ඒමේ සිටත්, ඊට නො දෙ වෙනි ව පැය 24 න් සිංහල රජ බස කිරීමත් හරහා ගොඩනැඟුණු ව්‍යවස්ථාමය පහරකෑම් ද මෙහි දී මතකයට නඟාගනු වටී. අනතුරුව යාපන පුස්තකාලයට අත් වූ ඉරණම හා සිංහල - දමිළ කලා උළෙල ට එල්ල කළ තිරිසන් ප්‍රහාරය දක්වා තවත් පරිඡේදයක් ලියැ වී ඇත්තේ ය. මේ වන විට එය වෙනත් වටයකින් සිදු කරනු ලබන වාර්ගික ශුද්ධයකට මඟ හෙළි කිරීමට සමත් වූයේ, කොළඹ නවාතැන් පොළවලින් එක් ජාතිකත්වයක් පමණක් කුදලා ගෙන ගොස් ( ඔවුන්ගේ නිජ බිමේ ) අතරමං කිරීමෙනි.

සංස්කෘතික බැඳීම්, යුද වියදම් හා මානුෂීය වාර්තාකරණය පිළිබඳ මුලින් ඉඟි කොට දුන් මා සඳහන් කරන්නේ වළලා දැමිය යුතු ඉතිහාසයක් නො වේ ද යි දුන් කෙනෙකුට ප්‍රශ්නයක් නැගෙනු ඇත. වත්මන් අර්බුදය දෙස විචාරශීලී ව නෙත් - සිත් යොමන පාඨක ඔබට එසේ සිතුණා නම් එය යහපතකි. එහෙත් එය මේ දැනුම් මඟට ප්‍රවේශයක් පමණි. එසේ නම් අප පළමුව කතා කළ යුත්තේ මේ අර්බුදය තුළ වන භෞතික සම්පත් විනාශය ගැන නො ව, පරිණාමය වන මිනිසත් බව තුළ වන ආකල්පයන්ට සැබෑ ලෙස ම සත්‍යයේ ජීවය පිඹිය හැකි වස්තු බීජයන් ගැන ය. යුද්ධයෙන් විනාශවන සංස්කෘතික වටිනාකම් ගැන ය. සැකය, බිය හා අවිශ්වාසය මත ඇත් වන සබඳතා ගැන ය.

බහු සංස්කෘති, බහු ආගමික, බහු ජාතිකත්ව හෙබි සමාජයක්, එක පවුලක් ලෙස ඇතැම්හු සරලව අර්ථ දක්වන හෙවත් ශ්‍රී ලාංකේය ජාතියක් ලෙස අභිමානී ලෙස ගොඩනැගෙන්නේ එම සංවාදය හරවත් ව අවසන් කළහොත් පමණි.

***ජනිත් විපුලගුණ***

*2007 ජූලි 04*